රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 19/2022

මගේ අංකය : Pns/P5/08/17
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2022.09.14

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රාජ්‍ය නිලධරයන්ගේ අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා අඩු කිරීම**

ගරු මුදල් අමාත්‍යතුමන් විසින් 2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද 2022.08.30 දිනැති අතුරු අයවැය කථාව - 2022 හි රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ යටතේ වූ 11:2 යෝජනාව අනුව රාජ්‍ය නිලධරයන්ගේ අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා අඩු කිරීමේ යෝජනාව පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන ලද අතර, ඒ අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට අවශ්‍ය සංශෝධන කිරීමට 2022.09.12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

02. ඒ අනුව 2022.01.06 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2022, 2022.12.31 දිනෙන් පසු අවලංගු කරනු ලබන අතර, අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හෝ අධිකරණ සංවිධාන පනත මඟින් හෝ නිශ්චිතව තීරණය කර ඇති අධිකරණ සේවයේ නිලධරයන් හැර අනෙකුත් සියලුම රාජ්‍ය නිලධරයන් සඳහා මෙම සංශෝධනය අදාළ වේ.

03. ඒ අනුව මෙම අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රජයේ නිලධරයන් විශ්‍රාම ගැනීම/ ගැන්වීම සම්බන්ධයෙන් පහත පරිදි ක්‍රියා කළ යුතුය.

3.1. 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම රාජ්‍ය නිලධරයන්ගේ අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 ලෙස සලකා කටයුතු කිරීම.

3.2. වයස අවුරුදු 60 ඉක්මවා දැනට සේවයේ යෙදී සිටින සහ 2022.12.31 දින හෝ එදිනට පෙර වයස අවුරුදු 60 සම්පූර්ණ වන නිලධරයන්හට ද ඔවුන්ගේ කැමැත්ත පරිදි 2022.12.31 දින හෝ ඊට ප්‍රථම හෝ විශ්‍රාම ගැනීමට අවස්ථාව ලබා දීම.

3.3. එපරිදි විශ්‍රාම ගැනීමට නියමිත සියලුම නිලධරයන් තම විශ්‍රාම ඉල්ලුම්පත් අදාළ පත්කිරීම් බලධරයා මඟින් නිසි ක්‍රමවේදය අනුව අනුමත කරවා ගැනීම හා ඒවා නියමිත පරිදි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීම.

3.4. විශ්‍රාම පූර්ව නිවාඩු සම්බන්ධයෙන් 2010.09.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2010 හි 03 ඡේදය අනුව ක්‍රියා කිරීම.

3.5. අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 වීමෙන් පසුව යම් විශේෂඥ සේවාවක් ලබා ගැනීම අවශ්‍ය වන්නේ නම් දැනටමත් බලාත්මක 2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 අනුව ක්‍රියා කිරීම.

04. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනය යටතේ විශ්‍රාම වැටුප් හිමිකම ලබන නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් හිමිකම ලැබීමට අවශ්‍ය අවම සේවා කාලය වසර පහ සිට වසර දහය දක්වා දීර්ඝ කිරීම තවදුරටත් එලෙසම ක්‍රියාත්මක වේ.

05. මෙයට පෙර විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛවල සඳහන් අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව 2023.01.01 දින සිට අවුරුදු 60 ක් ලෙස සංශෝධනය විය යුතුය.

06. මෙම චක්‍රලේඛය මුදල් අමාත්‍යාංශයේ එකඟතාව ඇතිව නිකුත් කරන අතර, මෙම නියමයන්ට අනුව රාජ්‍ය නිලධරයන්ගේ අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා අඩු කිරීමට අදාළව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීමට ඉදිරියේ දී පියවර ගනු ලැබේ.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-682460
ෆැක්ස් : 0112-698460
විද්‍යුත් ලිපිනය : pubad.aspension@gmail.com